පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය: 79

ආයතනයේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු ආයතන හා අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉතිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 79

நிறுவனத்தின் பெயர் : மாவட்டச் செயலகம், மன்னார்

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் நிறுவனங்களிற்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No : 79

Name of the institution: District Secretariat, Mannar

Submission of observation of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පොදු ගිණුම් කාරක සභාවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට තොරතුරු සැපයීම

පාර්ලිමේන්තු යොමු අංකය: 79

ආයතනයේ නම: දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මන්නාරම

අ.අ	කමිටුව විසින් හඳුනාගෙන ඇති අඩුපාඩු	අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග / වත්මන් තත්ත්වය
01	පුපුරණ ද්‍රව්‍ය නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	පුපුරණ ද්‍රව්‍ය ලේඛනය දැන් යාවත්කාලීන කර ඇත.
02	අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත.	අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීන පදනමක් පවත්වා ගැනීමට ක්‍රියාමාර්ගය ගෙන ඇත.
03	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය.	අදාළ නිලධාරීන් වෙත අවශ්‍ය උපදෙස් ලබා දීම තුළින් මාසයක් ඇතුළත පිළිතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.
04	වාහනයක් ගරහිත වී මාස 8 වැඩ අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි.	එම වාහනය රක්ෂණ සමාගම වෙත ලබාදීමට ලේකම්වරයාගෙන් අනුමැතිය ලැබිණි.
05	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	චෙක්පත් වංචාව සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නැතිවූ මුදල යම් නිලධාරියෙකුගෙන් ලබාගැනීමට පියවර ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී.
06	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි.	වැඩ තහනමට ලක්වූ නිලධාරීන් වන එස්.සෙල්වලක්සන් මහතා (කළ.සේ.නි) සහ එන්.ඩෙල්වින් කුලාස් (ග්‍රා.නි) යන මහත්වරුන්ගේ ණය මුදල් අර්ධ වශයෙන් පියවා ඇති අතර හිඟ ශේෂය අඩු වී ඇත. එමෙන්ම ඒ.මලීස් මහතාගේ (රියදුරු) ණය මුදල් ඔහුගේ ඇපකරුගෙන් මාසිකව අය කර ගන්නා ලදී. විශ්‍රාමික නිලධාරීන්ගේ ණය ශේෂය ඔවුන්ගේ විශ්‍රාම වැටුප / පාරිතෝෂය ලැබීමෙන් පසු සම්පූර්ණයෙන් අය කර ගැනීමට කටයුතු යොදා ඇත.
07	මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම පවත්වා නොතිබුණි.	මේ වන විට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් මාසිකව පැවැත්වේ.

08	දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබුණි.	දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව කැඳවනු ලැබේ.
09	දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබුණි.	දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව කැඳවීමට ක්‍රියාමාර්ගය ගෙන ඇත.
10	දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු මාසිකව රැස් වී නොතිබුණි.	දිස්ත්‍රික් මිළ නියම කිරීමේ කමිටු මාසිකව කැඳවීමට කටයුතු ගෙන ඇත.
11	2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. ආයතනයේ පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 24.01.2018 දිනැති චක්‍රලේඛ අංක 05/2018(1) අනුව, පුරවැසි හා සේවාලාභීන් සඳහා වන ප්‍රඥප්තිය නිසි ලෙස සකස් කර ඇති අතර ආයතනය මගින් එම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම ,අධීක්ෂණය කිරීම සහ ඇගයීම් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර ඇත.
12	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය.	ආයතනයේ ගිණුම් පිළිබඳ සුදුසුකම් ලත් විගණන මතයක් හැකි ඉක්මනින් ලබා ගැනීමට කටයුතු කර ඇත.
13	හඳුනාගත් කාර්ය දර්ශකයේ ලඟාවීම 24%ට වඩා අඩු ප්‍රමාණයෙන් විය.	හඳුනාගත් කාර්ය දර්ශකයේ ලඟාවීම 74.5% ප්‍රමාණයෙන් විය.
14	දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබුණි.	කාර්තුවකට වරක් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් පැවැත්වීමට දැනට කටයුතු කර ඇත.
15	ළමා අයිතිවාසිකම් පිළිබඳ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබුණි.	කාර්තුවකට වරක් ළමා අයිතිවාසිකම් පිළිබඳ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව පැවැත්වීමට කටයුතු කර ඇත.
16	දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව අවම වශයෙන් කාර්තුවකට වරක් රැස් වී නොතිබුණි.	කාර්තුවකට දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටුව කැඳවීමට කටයුතු ගෙන ඇත.
17	2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පණත අනුව ආපදා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.	2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පණත අනුව ආපදා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇත.

18	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත
19	දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 02 කට වරක් රැස් වී නොතිබුණි.	දිස්ත්‍රික් පරිසර කමිටුව මාස දෙකකට වරක් කැඳවීමට කටයුතු කර ඇත.
20	තිරසර සංවර්ධන හා වන ජීවී අමාත්‍යාංශයේ 2016.11.17 දිනැති අංක SDW/3/3/16-2016 චක්‍රලේඛයේ උපදෙස් පරිදි වන අලි හානි පිළිබඳ වන්දි කමිටුව රැස් වී නොතිබුණි.	තිරසර සංවර්ධන හා වන ජීවී අමාත්‍යාංශයේ 2016.11.17 දිනැති අංක SDW/3/3/16-2016 චක්‍රලේඛයේ උපදෙස් පරිදි වන අලි හානි පිළිබඳ වන්දි කමිටුව පැවැත්වීමට කටයුතු කර ඇත.

දිස්ත්‍රික් ලේකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

ක.කනකේස්වරන්
දිසාපති / දිස්ත්‍රික් ලේකම්
මන්නාරම දිස්ත්‍රික්

ප්‍රධාන ගණකාධිකාරී

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

K.Yogendran
Chief Accountant
District Secretariat
Mannar.